ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

காணிசீர்திருத்தஆணைக்குழு

Land Reform Commission

ඉඩම් අමාත්‍යාංශය

காணிஅமைச்சு

Ministry Of Lands

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

ஆண்டுறிக்ஜகமற்றும் குணக்குறிக்ஜக

Annual Performance Report

2015

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

2015

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

අංක 475

කඩුවෙල පාර

බත්තරමුල්ල

ශ්‍රී ලංකාව

දූරකථන: 0113520162

ෆැක්ස්: 0112878052

විද්‍යුත් තැපෑල: chairman@lrc.gov.lk

වෙබ්: www.lrc.gov.lk

සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ සංවර්ධන අරමුණු හා ඉලක්ක ප්‍රශස්ත අයුරින් සාක්ෂාත් කරගැනීමට ඉවහල් වන ප්‍රබලතම සම්පත වන ඉඩම් සම්පත සුළුතරයක් විසින් භුක්ති විඳීම වෙනුවට මෙරටේ සැබෑම උරුමකරුවන් වන මහජනතාව වෙත පත්කිරීමේ අරමුණින් දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් විසින් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවන ලදි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා දශක 05කට ආසන්න වන මේ අවස්ථාවේ තවදුරටත් නීතිමය බැඳීම් අවසන් කිරීම, ඉඩම්වල පදිංචිව සිටින ජනතාවට ඔප්පු ලබාදීම, පූජනීය ස්ථාන වලට ඔප්පු ලබා දීම, රාජ්‍ය ආයතන විසින් බුක්ති විඳින ඉඩම් නියමානුකූල කිරීම මෙන්ම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රැකී රක්ෂා ප්‍රවර්ධනය කිරීම සහ රාජ්‍ය ආදායම් උත්පාදනය තුළින් දේශීය කෘෂි ආර්ථිකය ගොඩනැගීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ඵලදායිව යොදා ගැනීම මෙන්ම නීති විරෝධී ක්‍රම වලින් බැහැර කර ඇති ඉඩම් හඳුනාගෙන ඒවා නැවත පනතේ අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා යොදවා ගැනීම තවදුරටත් කල යුතුව ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යය ඉටු කිරීම සඳහා ගරු ඉඩම් අමාත්‍ය එස්.එම් චන්ද්‍රසේන මැතිතුමාගේ උපදෙස් මත කඩිනමින් ඉහත ගැටළුවලට අවශ්‍ය විසඳුම් ලබා දීමට අවශ්‍ය සැලසුම් මේ වන විටත් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව, 2015 වර්ෂයට අදාළ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

නීතිඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

පටුන

1.	දළ විශ්ලේෂණය	1
	1.1 හැදින්වීම	1
	1.2 දැක්ම මෙහෙවර සහ අරමුණු	2
	1.2.1 දැක්ම	2
	1.2.2 මෙහෙවර	2
	1.2.3 අරමුණු	2
	1.3 කාර්ය භාරය සහ සංවිධාන සැලැස්ම	3
	1.3.1 කාර්යයන්	3
	1.3.2 සංවිධාන සැලැස්ම	4
	1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	5
	1.4.1 ප්‍රධාන අංශයන්	5
	1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	5
2.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	5
	2.1 ආයතන ස්ථාපනය	5
	2.2 කොමිෂන් සභාවේ සංයුතිය	5
	2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්	5
3.	ආංශික ප්‍රගතිය	6
	3.1 කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය	6
	3.1.1 කාර්යය මණ්ඩල සංයුතිය	6
	3.1.2 ආයතනික කටයුතු	7
	3.1.3 භෞතික සම්පත් කළමනාකරණය	8
	3.2 ඉඩම් අංශය	9
	3.2.1 ඉඩම් පැවරීම් අංශය	9
	3.2.2 ඉඩම් උපරිම සීමා අංශය	9
	3.2.3 තක්සේරු හා වන්දි අංශය	9
	3.3 නීති අංශය	10
	3.3.1 නීති අංශයේ කාර්යභාරය	10
	3.4 මුදල් අංශය	11
	3.4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.	11
	3.4.2 අවසන් ගිණුම් වාර්තා	12
	3.5 අභ්‍යන්තර විගණක අංශය	16
	3.5.1 විගණනය සඳහා බලය	16
	3.5.2 වසර තුල ඉටු කරන ලද රාජකාරී	16
	3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල	17

ඇමුණුම

A .ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2015.12.31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව **18**

1. දළ විශ්ලේෂණය

1.1 හැඳින්වීම

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාවට 1972 දක්වා විහිදී යන ඉතිහාසයක් ඇත.

අවුරුදු 44 ක් පුරා කොමිපත් සභාවේ කාර්යභාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මෙන්ම රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙය වන ලදී. ඉඩම් හිමියන්ගේ නිතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජන වලට යෙදවීම කොමිපත් සභාවට ලැබිය යුතු ආදායම රැස්කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම සේවක මණ්ඩල පුහුණුව සහ සුභසාධනය ප්‍රධාන ප්‍රමුඛතාවයන් වේ.

වර්තමාන ශ්‍රී ලංකාවේ පෙරළිකාර දේශපාලන ගමන් මග සාර්ථක කරමින් රජයේ අරමුණු හා ප්‍රතිපත්තිවලට අනුව ඉඩම් කැබලි වැඩි ප්‍රමාණයක් මහජනයා අතරේ බෙදාදීමේ වැඩපිළිවල යටතේ එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිපත් සභාවේ කටයුතු මෙහෙයවීමට කටයුතු සම්පාදනය කර ඇත.

තවද මෙම වසර තුළ ආයතනයේ සේවක සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිතතාවයක් ඇති කරමින් නව ජීවයක් ලබාදීමේ වැඩසටහනක් දියත් කිරීම ආරම්භ කිරීමටද කටයුතු සම්පාදනය වෙමින් පවතී.

2015 වසර තුළ පහත සඳහන් ප්‍රමුඛතාවයන් විශේෂයෙන්ම හඳුනා ගැනීමට කටයුතු කර ඇත.

i. කොමිපත් සභාව සතු හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම.

ii. ඵලදායී නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම.

iii. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ වැඩපිළිවෙළ යටතේ කොමිපත් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදාදීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා නිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කර නිබූ වැඩසටහනට නව මුහුණුවරක් දී ජාතික කර්තව්‍යයක් ලෙස ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරවීම.

iv. ආදායම් වැඩිකිරීමේ වැඩසටහන්

a) රණවිරු සේවා අධිකාරිය
b) රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම
c) රාජ්‍ය ආයතන වලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම
d) බදු පදනම මත පුද්ගලයන්ට පවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම
e) කලුගල් බදුදීම හා ඒට අදාල ආදායම් රැස් කිරීම
f) මැණික් ඉඩම් වලට අදාලව නව රෙගුලාසි පනවා ආදායම් රැස් කිරීම
g) සිලිකා. ඩොලමයිට්. වැලි ආදි ඛනිජ ද්‍රව්‍ය ඇති ඉඩම් වලින් ආදායම් ලබා ගැනීම

ආයතනයේ මෙම කාර්යභාරය පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ආයතනයේ සියලුම නිලධාරීන්ගෙන් සමන්විත එක් එක් කාර්යයන් සඳහා කමිටු පත්කිරීම හා වැඩමුලු පැවැත්වීමද ආරම්භ කරන ලදී. එමෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.

රජයේ ප්‍රතිපත්ති වලට අදාලව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාවේ කාර්යභාරය මෙහෙයවීමට හා කඩිනමින් ක්‍රියාත්මක කරවීම ඉතා කාලෝචිත පියවරක් ලෙස සලකා නිරතුරුවම සාකච්ජා පවත්වා අවශ්‍ය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු පසුවිපරම් කිරීමද සිදුව ඇත. තවද මහජනයාගේ විවිධ ගැටලු සම්බන්ධයෙන් ඔවුන් කැඳවා පත්කල කමිටු මගින් සෘජු සාකච්ජාවක් පවත්වා කඩිනම් තීරණ ගැනීමද සිදු වී ඇත.

මීට අමතරව ඵලදායී ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම් ඇති උපදේශක කමිටුවේ නිර්දේශ මත ක්‍රියා කිරීම ආරම්භ කිරීමටද කටයුතු කර ඇත.

තවද, ගරු ඉඩම් අමාත්‍යතුමන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ කඩිනම් මෙහෙයවීම උපදෙස් සහ මගපෙන්වීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් පවරා ගත් ඉඩම් අතුරෙන් ගිලිහි ගොස් ඇති සම්පත්වලින් ආයතනයේ ප්‍රගතිය පමණක් නොව රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීමටද කටයුතු කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

1.2.2 මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරිමයට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා ඵලදායීතාවය ඉහළ නංවමින්ද භෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින්ද, ඉඩම් උපරිමය කාලානුරූපව බලාත්මක කරමින්ද, නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතුවල ආයෝජනය කරමින්ද, අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කළ හැකි ඉඩම් සංචිතයක් පවත්වාගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායකවීම.

1.2.3 අරමුණු

i. ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශි කිරීම.
   a) ප්‍රකාශිත එහෙත් හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම
   b) මහජනතාව වෙතින් ලැබෙන තොරතුරු අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනා ගැනීම
   c) පැවරීම් කළද එම කාර්යය ඉටු නොවන්නේ නම් එම ඉඩම් කොමිෂන් සභාව සතු කර ගැනීම

ii. කොමිෂන් සභාව වෙත පැවරුණු ඉඩම් පිළිබඳ.
   a) ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නිශ්චය හා නිතීමය බැඳීම් නිදහස් කිරීම
   b) උපරිමයට වැඩි ඉඩම් කොමිෂන් සභාව වෙත පවරා ගැනීම
   c) පවරාගත් ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීම
   d) ප්‍රකාශ කරන ලද එහෙත් ප්‍රකාශ නොවන අයගේ ඉඩම් ආපසු ලබාදීම යන කාර්යයන් කිරීම

iii. රටේ ආර්ථිකය සමාජ සංවර්ධනය උදෙසා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා පනතේ ප්‍රතිපාදන අනුව පවරා ගනු ලැබූ ඉඩම් ඵලදායී ලෙස ආයෝජන කාර්යයන්හි යෙදවීම

iv. කොමිෂන් සභාව සතු ඉඩම් වලින් ලැබිය යුතු ආදායම් රැස් කිරීම හා එයින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය ලබාදීම

1.3 කාර්යභාරය සහ සංවිධාන සැලැස්ම

1.3.1 කාර්යයන්

i. ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නිත්‍යානුකූල කිරීම.

ii. උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිෂන් සභාව සතු කර ගැනීම.

iii. පනත්වලින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නිතිමය බැඳීම් නිදහස් කිරීම.

iv. කොමිපත් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට චන්දි මුදල් ගෙවීම.

v. පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.

vi. ඉඩම් ලේඛණ යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම.

a) ප්‍රකාශ කර ඇති නමුත් හඳුනාගෙන නොමැති ඉඩම්

b) උපරිමයට වැඩි ප්‍රකාශ නොකරන ලද ඉඩම්

c) පවරා දී ඇති නමුත් ඵලදායී ආයෝජනයක් නොකරන ලද ඉඩම්

vii. රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.

a) ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

b) කෘෂිකාර්මික ව්‍යාපෘති සහ වගා කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

c) කර්මාන්ත සඳහා ඉඩම් ලබාදීම.

viii. රටේ සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම.

a) ඉඩම් නොමැති ජනතාවට නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම.

b) රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ගනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.

c) ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් ලබාදීම

d) ජනතාව වෙනුවෙන් පොදු කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

e) රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉඩම් ලබාදීම.

ix. ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

a) භූමියේ ඇති සම්පත් වලින් ආදායම් රැස් කිරීම

b) බදු පදනම මත ඉඩම් පැවරුම් කර බදු ආදායම් රැස් කිරීම.

c) රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලයින්ගේ ලැබිය යුතු මුදල් අය කර ගැනීම.

x. ආයතනයේ සංවිධාන ව්‍යුහය ව්‍යුහගත කිරීම.

a) පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම

b) විධිමත් රාජකාරී පැවරුමක් කිරීම

c) බලතල විමධ්‍යගත කරමින් රාජකාරී පැවරුමක් කිරීම

d) සාකච්ජා, වැඩමුළු, පුහුණුවීම් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.

xi. ආයතනයේ කාර්යක්ෂම ඵලදායිතාවයක් ඇති කරලීමට භෞතික සම්පත් සම්පාදනය හා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

1.3.2 සංවිධාන සැලැස්ම



1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

1.4.1 ප්‍රධාන අංශයයන්

i. කළමණාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය
ii. ඉඩම් අංශය
iii. මුදල් අංශය
iv. නීති අංශය

1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාල 20කින් සමන්විත වේ.

2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

2.1 ආයතනය ස්ථාපනය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභා පනත මගින් පිහිටුවා ඇත.

2.2 කොමිෂන් සභාවේ සංයුතිය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවේ සංයුතිය මෙසේය.

i. ගරු විපය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන	- සභාපති
ii. ගරු විපය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින්	-05
iii. නිල බලයෙන් පත්වන සාමාජිකයින්	-03

කොමිසන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේහිලා උපයෝගි කරගනු ලබනුයේ මෙම කොමිසන් සභා මණ්ඩලය මගින් ගනු ලබන තීරණ හා අනුමැතියන් වන අතර, එක් එක් කාර්යයට කොමිසන් සභා මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2015.12.31 දින දක්වා කොමිසන් සභා මණ්ඩල රැස්වීම් 674 ක් පවත්වා ඇත.

2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

i. 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත
ii. 1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iii. 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iv. 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
v. 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
vi. 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත

අංක (i) හා (ii) පනත් අනුව, දේශීය ප්‍රකාශකයින්ගෙන්, රන් පවුම් සමාගම්වලින් හා රුපියල් සමාගම්වලින් ඉඩම් අක්කර 1,048,208 රූඩ් 2 පර්. 01 ක් ඉඩම් ප්‍රතිසංසක්රණ කොමිසන් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක (i) හා (ii) පනත් සම්බන්ධව,

i. සංශෝධනයන් - අංක iii හා vi පනත් වලින්ද
ii. විධිවිධානයන් - අංක iv, v හා vi පනත් වලින්ද සලසා ඇත.

3. ආංශික ප්‍රගතිය

3.1 කළමණාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

3.1.1 කාර්ය මණ්ඩල සංයුතිය

වගුව 3.1: 2015 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

අනු අංකය	තනතුරු නාමය	අනුමත තනතුර සංඛ්‍යාව	ප්‍රවර්තන වර්ෂයේ සිටි සංඛ්‍යාව (2015)	අතිරික්තය / ඌනතාවය
1.	අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
2.	ලේකම් /අධ්‍යක්ෂ (පාලන)	01	01	-
3.	අධ්‍යක්ෂ (මුදල්)	01	-	01
4.	අධ්‍යක්ෂ (ඉඩම්)	01	-	01
5.	අධ්‍යක්ෂ (නීති)	01	-	01
6.	අභ්‍යන්තර විගණක	01	01	-
7.	සහකාර අධ්‍යක්ෂ (පාලන)	01	01	-
8.	සහකාර අධ්‍යක්ෂ (මුදල්)	02	02	-
9.	සහකාර අධ්‍යක්ෂ (නීති)	03	03	-
10.	සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)	01	01	-
11.	සහකාර අධ්‍යක්ෂ (කලාප)	20	20	-
12.	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	01	01	-
13.	සහකාර අධ්‍යක්ෂ (ඉඩම් උපරිම සීමා)	01	01	-
14.	සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පැවරීම්)	01	01	-
15.	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි)	01	01	-
16.	සහකාර අධ්‍යක්ෂ (මැණුම්)	01	01	-
17.	ගිණුම් නිලධාරී	01	-	01
18.	පරිපාලන නිලධාරී	01	-	01
19.	තොරතුරු තාක්ෂණ නිලධාරී	01	01	-
20.	පුද්ගලික සහකාර	01(පුද්ගලික වන සේ)	01	-
21.	තක්සේරු පරීක්ෂක	01	-	01
22.	තක්සේරු නිලධාරී	03	-	(03)
23.	මාණ්ඩලික සහකාර	23(පුද්ගලික වන සේ)	23	-
24.	ගිණුම් නිලධාරී	05(පුද්ගලික වන සේ)	04	01
25.	සැලසුම් ශිල්පී	02	-	(02)
26.	ප්‍රවාහන සහකාර	01	01	-
27.	කළමනාකරණ සහකාර	215	243	12
		40 (පුද්ගලික වන සේ)		-
28.	රියදුරු	17	18	01
29.	කාර්යාල සහායක	44	45	01
	එකතුව	**392**	**371**	

3.1.2 ආයතනික කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවේ 2014 වර්ෂය හා සසඳමින් මෙම වර්ෂයේ ආයතනික කටයුතු කාර්යසාධනය 3.2 වගුව මගින් ඉදිරිපත්කොට ඇත.

වගුව 3.2: 2015 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

අනු අංකය	විස්තර	පෙර වර්ෂය (2014)			ප්‍රවර්තන වර්ෂය (2015)		
		ඉල්ලීම් සංඛ්‍යාව	අනුමත කළ සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව	ඉල්ලීම් සංඛ්‍යාව	අනුමත කළ සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව
1.	සේවයට බඳවා ගැනීම්	-	-	-	10	10	-
2.	විභාග පැවැත්වීම්	-	-	-	-	-	-
3.	සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම්	-	-	-	03	03	-
4.	සේවය ස්ථීර කිරීම්	05	05	-	05	05	-
5.	උසස් කිරීම්	-	-	-	-	-	-
6.	වැටුප් වර්ධක ගෙවීම්	300	297	03	304	295	09
7.	සේවය දීර්ඝ කිරීම්	02	02	-	02	02	-
8.	බඳවා ගැනීමේ පරිපාටි සැකසීම	-	-	-	-	-	-
9.	සේවය හැර යෑම්	-	-	-	-	-	-
10.	වැඩ තහනම් කිරීම්	03	03	-	03	03	-
11.	නැවත සේවයේ පිහිටුවීම්	-	-	-	-	-	-
12.	විනය පරීක්ෂණ	02	02	-	04	04	-
13.	විදේශ නිවාඩු අනුමත කිරීම්	01	01	-	03	03	-
14.	පුනුණු කිරීම	10	10	-	01	01	-
15.	අමාත්‍ය මණ්ඩල සංදේශ	-	-	-	-	-	-
16.	ඇප ආරම්භ කිරීම්	-	-	-	-	-	-
17.	ඇප නිදහස් කිරීම්	-	-	-	06	06	-
18.	ණය අනුමත කිරීම I. දේපල II. වාහන III. වෙනත්	- - 119	- - 97	- - 22	- - 112	- - 97	- - 15

3.1.3 භෞතික සම්පත් කළමනාකරණය

3.3 වගුව මගින් 2015 වර්ෂයේ කොමිපත් සභාව වෙත භෞතික සම්පත් අත්පත් කරගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු දක්වා ඇත.

වගුව 3.3 : භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු

අනු අංකය	වත්කම් වර්ගය	වසර ආරම්භයේ පැවති තත්වය	වර්ෂය තුළ සිදු වූ වෙනස්කම්		වසර අවසානයේ පැවති තත්වය
			විකිණීම්	මිලදී ගැනීම්	
1.	කැබ් රථ	12	-	-	12
2.	මෝටර් රථ	02	-	-	02
3.	මයික්‍රෝ කයිරන් පීප් රථ	01	-	-	01
4.	වෑන්	01	-	-	01
5.	මුදල් නෝට්ටු ගණනය කිරීමේ යන්ත්‍ර	-	-	01	01
6.	ඩුප්ලෝ යන්ත්‍ර	01	-	-	01
7.	ජායා පිටපත් යන්ත්‍ර	06	-	-	06
8.	පරිගණක	47	-	-	47
9.	පරිගණක ප්‍රින්ටර්ස්	31	-	-	31
10.	ලැප්ටොප් පරිගණක	01	-	-	01
11.	ෆැක්ස් යන්ත්‍ර	20	-	-	20
12.	යතුරු ලියන	03	-	-	03
13.	සේප්පු	10	-	-	10
14.	කැමරා	01	-	-	01
15.	රූපවාහිනී යන්ත්‍ර	01	-	-	01
16.	ශීතකරණ	02	-	-	02
17.	ශබ්ද විකාශන යන්ත්‍ර	01	-	-	01
18.	රෝනියෝ යන්ත්‍ර	02	-	-	02

3.2 ඉඩම් අංශය

3.2.1 ඉඩම් පැවරීම් අංශය

3.4 වගුව මගින් 2015 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්යසාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3.4: 2015 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්යසාධනය

අනු අංකය	ව්‍යාපෘති	වාර්ෂික ඉලක්කය	නිම කළ සංඛ්‍යාව
1.	ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා බදුදීම	10	10
2.	අනුමත කෘෂිකාර්මික නෝ කාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීම (ව්‍යාපෘති කම්ටු වෙත ඉදිරිපත් කිරීම)	30	26
3.	නිවාස අරමුණු හා ජීවනෝපාය සලසා ගැනීමේ අවශ්‍යතාවය මත ඉඩම් විකිණීම් හා බදුදීම්	6000	845
4.	විවිධ රාජ්‍ය ආයතන වලට පොදු කටයුතු සඳහා ඉඩම් විකිණීම්/ බදුදීම	02	02
5.	දැව සම්පත් ආශ්‍රිත ආර්ථික උපයෝජන(ව්‍යාපෘති ටෙන්ඩර් මගින් විකිණීම)	40	40
6.	ඛණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති (වැලි. කළු ගල්. සිලිකා. මැණික්. මොලමයිට්)	11	11

3.2.2 ඉඩම් උපරිම සීමා අංශය

3.5 වගුව මගින් 2015 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්යසාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3.5: 2015 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්යසාධනය

අනු අංකය	විස්තරය	ඉලක්කය	නිම වූ සංඛ්‍යාව
1.	19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් ලබාදීම	72	09
2.	14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම	14	04
3.	22 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම	10	09
4.	ප්‍රකාශ නොවන අයගේ ඉඩම් නිදහස් කිරීම	24	

3.2.3 තක්සේරු සහ වන්දි අංශය

3.6 වගුව මගින් 2015 වර්ෂයේ තක්සේරු සහ වන්දි අංශයේ කාර්යසාධනය පෙනනුම් කරනු ලබයි.

වගුව 3.6: 2015 වර්ෂයේ තක්සේරු සහ වන්දි අංශයේ කාර්යසාධනය

අනු අංකය	විස්තරය	ප්‍රකාශකයින් ගණන	ගෙවූ මුදල (රු.)
1.	වන්දි ගෙවීම්/ පොළී ගෙවීම	01	28,184.51
2.	ඉඩම් විකිණීම් හා බදුදීම් සඳහා තක්සේරු කැඳවීම	55	-
3.	ප්‍රධාන තක්සේරු කරුගෙන් තක්සේරු කැඳවා වාර්තා කිරීම	71	2,440,042.00

3.3 නීති අංශය

3.7 වගුව මගින් 2015 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙහෙයවනු ලැබූ නඩු කටයුතු පිළබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.

වගුව 3. 7: 2015 වර්ෂයේ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යා දත්ත

අනු අංකය	විස්තරය	2014.12.31 දිනට පවතින නඩු	2015 වර්ෂය තුළ තිම වූ සමතයට පත් වූ නඩු	2015 වර්ෂය තුල පවරන ලද නඩු සංඛ්‍යාව	2015.12.31 දිනට පැවැති නඩු සංඛ්‍යාව
1.	ශ්‍රේෂ්ඨාධිකරණය	27	-	-	27
2.	අභියාචනාධිකරණය	34	02	-	32
3.	මහාධිකරණය	09	02	01	08
4.	දිසා අධිකරණය	460	01	11	470
5.	මහේස්ත්‍රාත් අධිකරණය	40	-	-	40
6.	ප්‍රාථමික අධිකරණය	-	-	-	-
7.	කම්කරු විනිශ්චය සභාව	-	-	-	-
8.	කම්කරු ආරවුල්	-	-	-	-
9.	මානව හිමිකම් කොමිෂන් සභා	-	-	01	01
10.	ඔම්බුඩස්මන්	-	-	-	-
11.	සිවිල් අධිකරණය	23	01	03	25
	එකතුව	**593**	**06**	**16**	**603**

3.4 මූදල් අංශය

3.4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව සකස් කර ඇත.
- සියලුම ගනුදෙනු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) නියෝජනය වේ.
- වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා නැවත වර්ගීකරණය කර ඇත.
- අවසාන ගිණුම් සකස් කිරීම සඳහා උපචිත ක්‍රමය භාවිතා කිරීම.

මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සියලුම දේපල, පිරියත සහ උපකරණ පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් වලින් දක්වා ඇත.

ක්ෂයවීම් ප්‍රතිපත්තිය

- **අඩු කිරීමේ ශේෂ ක්‍රමය මත පදනම්ව වත්කම් ක්ෂය වේ.**
- **වර්ෂය තුළ මිලදී ගත් වත්කමක් මිලදී ගත් දිනයේ සිට ක්ෂය වේ.**
- **වත්කම් වර්ගීකරණය සහ ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.**

වත්කම්	ක්ෂයවීම් අනුපාතය
❖ ගොඩනැගිලි	**10%**
❖ පරිගණක උපකරණ	**20%**
❖ ගෘහ භාණ්ඩ උපකරණ	**7.5%**
❖ මෝටර් වාහන	**20%**
❖ කාර්යාල උපකරණ	**10%**
❖ සුභසාධන උපකරණ	**10%**

පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනීකරණය

- ❖ පවරා ඇති ඉඩමේ ප්‍රාග්ධන වටිනාකම් ගෙවිය යුතු වන්දි මුදල් මත පදනම් වූ වටිනාකම් පමණක් නොව, පුනරාවර්තන වියදම්වලින් ප්‍රතිශතයක් ද ප්‍රාග්ධන අගයට එකතු වේ.

- ❖ ඉඩම් ප්‍රසංස්කරණ නීතියේ 54 වැනි වගන්තිය යටතේ පහත සඳහන් ප්‍රතිශත භාවිතා කරමින් ඉඩම්/අත්පත්වල ප්‍රාග්ධන වටිනාකම් වැඩි කිරීමට කොමිෂන් සභාව පහත සඳහන් පුනරාවර්තන වියදම් අනුමත කර ඇත.

❖ නීති ගාස්තු	100%
❖ තක්සේරු ගාස්තු	100%
❖ මිණුම්කරණ ගාස්තු	100%
❖ පරිවර්තන ගාස්තු	100%
❖ ප්‍රචාරණ ගාස්තු	100%

❖ මෙය 1990/02/08 දින අංක 2918 සහ අංක 2959 දරන කොමිෂන් සභා පත්‍රිකා මඟින් හා අනුමත කරන ලදී.

පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන

අඛණ්ඩව වසර පහක් හෝ වසර පහකට වැඩි කාලයක් තම සේවය සම්පූර්ණ කළ සේවකයින් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන සලසා ඇත.

පාරිතෝෂිත ප්‍රතිපාදන = මූලික වැටුප * (සේවා වසර ගණන * 1/2)

3.4.2 අවසන් ගිණුම් වාර්තා

වගුව 3.8: 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

විස්තරය	සටහන්	31.12.2015 රු.	31.12.2014 රු.
අදායම	1	248,,206,406.34	223,565,721.41
වෙනත් මෙහෙයුම් ආදායම්	2	65,692,293.96	102,339,485.53
මුළු ආදායම්		**313,898,700.30**	**325,905,206.94**
පරිපාලන වියදම්	3	233,639,440.07	223,355,075.14
සැපයුම් සහ අවශ්‍ය වියදම්	4	9,588,476.91	11,211,248.39
අනෙකුත් මෙහෙයුම් වියදම්	5	10,033,323.10	12,170,565.51
මූල්‍ය වියදම්	6	4,929,010.27	5,193,735.10
මුළු වියදම්		**258,190,250.35**	**251,930,624.14**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		**55,708,449.95**	**73,974,582.80**
2015.01.01 දිනට ආරම්භක ශුද්ධ අතිරික්තය		833,056,330.43	745,925,846.17
පෙර වර්ෂය සඳහා ගැලපීම්		13,666,001.45	
2015.12.31 දිනට ශුද්ධ අතිරික්තය		**902,430,781.83**	**819,900,428.97**

.....

එස්.පී.එස්.සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

එස්. පී. එස්. සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

.....

නීතිඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

නීතිඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

.....

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වගුව 3.9: 2015.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය			
විස්තරය	සටහන්	2015.12.31 රු.	2014.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
ආයෝජන	12	1,233,664,542.00	1,036,957,466.29
දේපල පිරියත හා උපකරණ	13	39,359,200.91	45,546,228.97
ලිදුල බංගලාව		641,118.00	
ෆාම්ගාඩන් වත්ත		228,746.50	
1972 අංක 01 දරණ පනත යටතේ පවරන ලද ඉඩම්		676,169,345.33	676,169,345.33
මුළු ජංගම නොවන වත්කම්		**1,950,062,952.74**	**1,758,673,040.59**
ජංගම වත්කම්			
තොග - ලිපි ද්‍රව්‍ය	11	2,711,069.50	2,174,603.00
වෙලඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	9	2,228,040,841.11	2,218,345,567.95
ලැබිය යුතු පොලී	8	22,120,214.97	20,727,959.34
නැමිපතු හා අත්තිකාරම්	10	61,273,578.75	59,677,971.85
ලැබිය යුතු ආදායම්		29,731,610.01	29,731,610.01
මුදල්, මුදල් හා සමාන දෑ	7	55,909,162.43	91,409,002.82
මුළු ජංගම වත්කම්		**2,399,786,476.77**	**2,433,850,238.48**
මුළු වත්කම්		**4,349,849,429.51**	**4,180,739,755.56**
වගකීම්			
සමුච්චිත අරමුදල් හා සංචිත			
සංචිත	18	1,089,591,678.23	1,004,152,080.20
සමුච්චිත අතිරික්තය		902,430,781.83	819,900,428.97
මුළු සමුච්චිත අරමුදල් හා සංචිත		**1,992,022,460.06**	**1,824,052,509.17**
අරමුදල් සහ ප්‍රධාන			
රජයේ දායකත්වය හා භාන්ඩාගාර ප්‍රධාන	17	1,964,075,000.00	1,964,075,000.00
මුළු අරමුදල් සහ ප්‍රධාන		**1,964,075,000.00**	**1,964,075,000.00**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	16	61,569,030.00	58,131,775.50
කල්බදු ණය හිමියන්		-	3,508,486.68
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර I		113,053,465.06	113,276,122.66
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර II		109,959,492.95	109,959,492.95
මුළු ජංගම නොවන වගකීම්		**284,581,988.01**	**284,875,877.79**
ජංගම වගකීම්			
වෙලඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	14	105,360,955.55	100,578,369.37
කල්බදු ණය හිමියන්	15	3,809,025.89	7,157,999.23
මුළු ජංගම වගකීම්		**109,169,981.44**	**107,608,656.13**
මුළු වගකීම්		**393,751,969.45**	**392,484,533.92**
මුළු වගකීම් හා සංචිත		**4,349,849,429.51**	**4,180,739,755.56**

වගුව 3.10: 2015.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
විස්තරය	සටහන්	31.12.2015 රු.	31.12.2014 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් අතිරික්තය		60,637,460.22	79,168,317.90
ගැළපුම්			
ක්ෂය කිරීම්		8,171,857.89	11,043,028.00
මූල්‍ය වියදම්		(4,929,010.27)	(5,193,735.10)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		**63,880,307.84**	**85,017,610.80**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
වෙලඳ හා වෙනත් ගෙවිය යුතු දෑ අඩුවීම් හෝ වැඩිවීම්		4,809,055.98	5,197,259.82
තැන්පතු හා අත්තිකාරම් අඩුවීම් හෝ වැඩිවීම්		517,272.10	(5,898,815.96)
ලැබියයුතු පොළී අඩුවීම් හෝ වැඩිවීම්		(1,410,742.71)	(394,685.66)
වෙලඳ සහ වෙනත් ලැබියයුතු අඩුවීම් හෝ වැඩිවීම්		(6,141.00)	300,954.00
තොග අඩුවීම් හෝ වැඩිවීම්		(536,466.50)	(734,757.96)
කල්බදු ණය හිමි			(1,893,484.56)
පාරිතෝෂික ගෙවීම්		3,437,254.50	20,382,195.50
වන්දි ගෙවීම්		(222,657.60)	(5,863,792.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**70,467,882.61**	**75,729,924.48**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
දෙපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම්		(1,300,038.50)	(1,318,726.40)
නොනිම් වැඩ ලියා හැරීම්		(278,590.00)	
ස්ථාවර නැනපතු සහ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන		(196,698,534.23)	(154,398,576.66)
මූල්‍ය ආදායම්			
මෝටර් වාහන බැහැර කිරීම්		-	2,098,536.09
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**(198,277,162.73)**	**(153,618,766.97)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
පාරිතෝෂික ගෙවීම්			20,382,195.50
ඉඩම් විකුණුම් ශු. වටිනාකම්		85,399,655.63	76,062,779.30
කල්බදු		(6,756,217.35)	(6,587,442.69)
මූල්‍ය පිරිවැය			
පෙර වසරේ ගැලපීම්		13,666,001.45	3,135,378.28
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**92,309,439.73**	**92,992,910.39**
මුදල් හා මුදල් සමාන දෑ හි ශු. වෙනස්වීම්		**(35,499,840.39)**	**15,104,067.90**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**91,409,002.82**	**76,304,934.92**
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම්		**55,909,162.43**	**91,409,002.82**

වගුව 3.11: 2015.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය					
විස්තරය	රජයේ දායකත්වය රු.	භාණ්ඩාගාර ප්‍රධාන රු.	ප්‍රාග්ධන සංචිත රු.	සමුච්චිත අතිරික්තය රු.	එකතුව රු.
2015.01.01 දිනට ආරම්භක ශේෂය	**15,000,000.00**	**1,949,075,000.00**	**1,004,192,022.60**	**833,056,330.43**	**3,801,323,353.03**
ඉඩම් විකුණුම් ශු. වටිනාකම (40%)			85,399,655.63		85,399,655.63
පෙර වර්ෂය සඳහා ගැලපීම්				13,666,001.45	13,666,001.45
අපහායනය ගැලපීම්					
වර්ෂය සඳහා අතිරික්තය				55,708,449.95	55,708,449.95
2015.12.31 දිනට ශේෂය	**15,000,000.00**	**1,949,075,000.00**	**1,089,591,678.23**	**902,430,781.83**	**3,956,097,460.06**

3.5 අභ්‍යන්තර විගණන අංශය

3.5.1 විගණනය සඳහා බලය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභා පනත හා 1971 අංක 38 දරණ මුදල් පනත අනුව සැකසුන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභා මුදල් සංග්‍රහයේ 11 වන කොටසේ 02 වන වගන්තියේ අනු වගන්ති 01 - 03 අනුව විගණන සඳහා බලය ලැබී ඇත.

3.5.2 වසර තුළ ඉටු කරන ලද රාජකාරි

i. කොමිපත් සභාව සතු භූමියේ හිමිකම තහවුරු කර විවිධ ආයතන හා පුද්ගලයන්ට විකිණීම් හා බදු දීම් කරන ලද ඉඩම් ප්‍රතිපත්තිය යටතේ 2015 වසරට අදාළව මුදල් අය කර ගැනීමට තොරතුරු අනාවරණය කර වාර්තා කිරීම හා ලෙජර් විධිමත් කිරීමට පියවර ගැනීම.

ii. කොමිපත් සභාවට 1972 අංක 01 දරණ පනත යටතේ පැවරුන කෘෂිකාර්මික ඉඩම් සඳහා ප්‍රකාශකයින්ට වන්දි ගෙවීම සඳහා ලිපි ගොනු 14 ක්ද එම පොළි ගෙවීම් ලිපි ගොනු 06 ක්ද පූර්ව විගණනයට ලක්කර ගෙවීම් සඳහා යොමු කිරීම

iii. දිස්ත්‍රික් බල මණ්ඩල වල මූල්‍ය තත්ත්වයන් ඇගයීමට ලක්කර ඒවායේ කටයුතු විධිමත් කිරීම හා ප්‍රවර්ධනය කළ යුතු ආකාරය සම්බන්ධව වාර්තා කිරීම

iv. විගණකාධිපති විසින් යොමු කරන ලද විමසුම් වලට අදාළව පිළිතුරු යැවීම පිණිස නිරීක්ෂණ 14 ක් ඉදිරිපත් කිරීම

v. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක කටයුතු සම්බන්ධීකරණය කිරීම

vi. ඒදිනෙදා කාර්යාලීය අවශ්‍යතා මත සාමාන්‍ය මිලදී ගැනීම් ප්‍රසම්පාදන මණ්ඩල කටයුතු සහ විවිධ ගෙවීම් කටයුතු පරීක්ෂා කිරීම.

3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

සභාව දිවයින පුරා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් පැතිරී පවතින දිස්ත්‍රික් කාර්යාල 20 කින් සමන්විත වේ. මෙම දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල කාර්යාල විසින් පහත කටයුතු සිදුකරනු ලබයි.

1. බස්නාහිර පළාත	කොළඹ කළුතර ගම්පහ	සෙන්ට්‍රල් ෆාමසි ගොඩනැගිල්ල. පාදුක්ක අංක 220. පරණ පාර. කළුතර ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ගොඩනැගිල්ල. කච්චේරිය. ගම්පහ
2. දකුණු පළාත	ගාල්ල මාතර තංගල්ල	අංක. 27. රිච්මන්ඩ්කන්ද පාර. කළුවැල්ල. ගාල්ල අංක 17/ජී. ධර්මරත්න පාර. උයන්වත්ත. මාතර උසාවිය පාර. තංගල්ල
3. ඌව පළාත	මොණරාගල බදුල්ල	ජනසවි ගොඩනැගිල්ල. කච්චේරි හංදිය. මොණරාගල අංක 195. කැප්පෙටිපොළ පාර. බදුල්ල
4. නැගෙනහිර පළාත	අම්පාර මඩකලපුව	කච්චේරිය. අම්පාර කච්චේරිය. මඩකලපුව
5. උතුරුපළාත	යාපනය	කච්චේරිය. යාපනය
6. උතුරු මැද පළාත	අනුරාධපුර	කච්චේරිය. අනුරාධපුර
7. සබරගමුව පළාත	රත්නපුර ඇඹිලිපිටිය කෑගල්ල	ෆාම් ගාඩන් වත්ත. නව නගරය. රත්නපුර 12 බී. නොග ගබඩාව පාර. නව නගරය. ඇඹිලිපිටිය කච්චේරිය. කෑගල්ල
8. වයඹ පළාත	පුත්තලම කුරුණෑගල	පම්බල. කාකපල්ලිය. මාදම්පේ අංක 16. උතුරු වැව පාර. කුරුණෑගල
9. මධ්‍යම පළාත	නුවරඑළිය මහනුවර මාතලේ	I.R.D.P ගොඩනැගිල්ල. උඩුපුස්සැල්ලාව පාර. නුවරඑළිය සිව්වන මහල. නව දිසත්‍රික් ලේකම් කාර්යාලය,මහ නුවර කච්චේරිය. මාතලේ

- දිස්ත්‍රික් කාර්යාල පරිපාලනය හා අධික්ෂණ කටයුතු.
- අමාත්‍යංශය හා ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන සාකච්ජා හා සම්මන්ත්‍රණ වලට සහභාගි වීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව වෙනුවෙන් දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ජංගම සේවා වලට සහභාගි වීම
- කට්ටිකරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණ පැවැත්වීම
- රජයේ අවශ්‍යතාවය සඳහා ආයතන වලට හා පුද්ගලික ආයතන වලට ඉඩම් ලබා දීම.
- දිස්ත්‍රික් ඉඩම් ලේඛණ සැකසීම යාවත්කාලීන කිරීම හා ඊට අදාළ රාජකාරි කටයුතු
- දිස්ත්‍රික්කයේ ඉඩම් ලේඛනණ, බැහැර කළ ඉඩම් ලේඛණය හා අනවසර ලේඛණය යාවත්කාලීන කිරීම.
- මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ විගණන විමසීම් හා ලිපි සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමග සාකච්ජාකර ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ ඉඩම් නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ඊට අදාළ තොරතුරු, ප්‍රධාන කාර්යාලයේ තොරතුරු නිලධාරී වෙත නියමිත කාලයේදී ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන ඔප්පු ලබාදීමේ උත්සව සංවිධානය කිරීම.
- පවරාගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබා දීමට අදාළ කටයුතු
- රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම සම්බන්ධීකරණය හා පසු විපරම් කටයුතු.
- විධිමත් පරිදි අත්පත් කර නොගත් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- බෙදා දීමට සුදුසු ඉඩම් කොටස් මැණුම් කිරීම සඳහා පෙන්වා දී මිනින්දෝරුවන්ට සහය වීම.

ඇමුණුම්

A. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ **2015** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඒජිඑල්/ඒ/එල්ආර්සී/01/2015/15

මගේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2016 සැප්තැම්බර් දින

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත :-
1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

ඒජිඑල්/ඒ/එල්ආර්සී/01/2015/15 2016 සැප්තැම්බර් 20 දින

මගේ අංකය எனது இல. My No. | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 56 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ (13)(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2016 මැයි 20 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

(i) මූල්‍ය ප්‍රකාශනවල ගණුදෙනු හා සිද්ධීන් වාර්තා කිරීමේදී උපචිත පදනම මත ගිණුම්ගත කල යුතු වුවත් දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙන ආදායම්, මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ii) වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් ඉඩම් විකුණුම් මුළු ආදායම වූ රු. 213,499,139 ක මුදල මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ ද විසර්ජනයකල යුතු කොටස සංචිත යටතේ ද දක්වනු වෙනුවට ඉන් සියයට 60 ක ප්‍රමාණය වූ රු.128,099,483 ක් ආදායම් යටතේ ද ඉතිරි සියයට 40 වන රු.85,399,656 ක් සංචිත යටතේද දක්වා තිබුණි. ඒ අනුව ලැබුණු ආදායම්හි නියම ස්වරූපය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03</u>

පසුගිය වර්ෂ කිහිපයකට අදාළව බදු ඉඩම් වලින් හා 1995 වර්ෂයට පෙර ගෙවන ලද පාරිතෝෂික ඇතුළු අනෙකුත් දීමනා ප්‍රතිපූර්ණය කිරීමෙන් ලැබූ එකතුව රු.13,666,001 ක ආදායම අතීතානුයෝගීව ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂ ගැලපීම් ලෙස වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

(ඇ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08</u>

ඉඩමක අයිතිය ලබාගැනීම සඳහා සභාවට එරෙහිව පවරන ලද නඩුවක පැමිණිලිකරුවන් වෙත රු.148,715,363 ක් ගෙවීමට 2009 වර්ෂයේදී අභියාවනාධිකරණය තීන්දුවක් ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට

ඊට අදාල පොළියද සමඟ ගෙවිය යුතු මුදල රු.200,000,000 ක් ඉක්මවා තිබුණද ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි.

(ඇ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අස්පිත්වයක් විසින් නැවත විකිණීම සඳහා තබාගෙන ඇති ඉඩම් හා දේපල තොග ලෙස දැක්විය යුතු වුවත් විකිණීම සඳහා ඇති රු. 676,169,345 ක් වටිනා ඉඩම් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ii) විකිණීම සඳහා ඉහත දක්වා ඇති ඉඩම් මුල් වරට 1978 වර්ෂයේ තක්සේරු කර තිබූ අතර 2003 සහ 2006 වසරේදී කරනු ලැබූ සුළු ගැලපුමක් හැරුණු කොට 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම එකම වටිනාකමක් ලෙස දක්වා තිබුණි. මේ අනුව වර්ෂයක් පාසා සිදු කෙරෙන අත්පත් කර ගැනීම්, විකුණුම් ආදිය ගැලපීමෙන් පසු තවදුරටත් ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහාද ගැලපුම් නොකිරීම් හේතුවෙන් නිවැරදි වටිනාකමක් මෙම ශේෂ වලින් නිරූපනය නොවන බව නිරීක්ෂණය විය.

2.2.2. <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බදු කුලී ගෙවීමේ ප්‍රමාදය මත අයවිය යුතු අධිභාර රු.3,602,498 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) සභාව විසින් බදු දී තිබුණු බනිජ සම්පත් වලින් (කළුගල් වලින්) අයවිය යුතු හිඟ ආදායම් පිළිබඳව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර කලුතර දිස්ත්‍රික්කයෙන් පමණක් අයවීමට තිබූ හිඟ කළුගල් ආදායම රු.20,152,185 ක් විය.

(ඇ) සේවා කාලය වසර 1 සිට වසර 5 දක්වා වූ සේවකයන් 7 දෙනෙකු වෙනුවෙන් පාර්තෝෂික ප්‍රතිපාදනය රු.228,745 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.3. <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වන්දි අවිනිශ්චිත 1 සහ 2 අදියර යටතේ සමස්ත වගකීම රු.223,012,958 ක් වුවද තක්සේරු හා වන්දි අංශයේ වාර්තා අනුව ප්‍රකාශකයින් වෙත ගෙවීමට තිබූ පොලී මුදල් සහිත වන්දි මුදල රු.586,300,000 ක් විය. ඒ අනුව රු.363,287,042 ක වෙනසක් නිරීක්ෂණය වුයෙන් මෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආදායම් ශීර්ෂ 11ක ආදායම් ඊට සම්බන්ධ ආදායම් වාර්තා සමඟ සැසඳීමේදී රු.17,891,944 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ආදායම් අංශයේ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු කුලී ආදායම රු.171,128,621 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.87,915,051 ක් ලෙස දැක්වීමෙන් බදු කුලී ආදායමේ රු.83,213,570 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3. <u>ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 10 කට අධික කාලයක සිට රාජ්‍ය ආයතන 7 කින් අයවිය යුතු රු.2,132,372,712 ක්, වසර 1 සිට වසර 5 දක්වා කාලයක සිට සේවකයන් 46 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.748,589 ක් හා වසර 2 කට අධික කාලයක සිට අයවිය යුතු බදු කුලී රු.87,915,051 ක් අයකර ගැනීමට හෝ ගිණුම් වලින් නිරවුල් කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත්වී තිබුණි.

(ආ) ඉඩම් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සභාපතිගේ අනුමැතිය ඇතිව අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබූ රත්නගුම් ඔප්පු ප්‍රදානය වැඩසටහනේ ප්‍රචාරක කටයුතු සැලසුම් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2003 වර්ෂයේදී රු.3,252,654 ක මුදලක් ගෙවා තිබුණි. වර්ෂ 12 ක් නිස්සේ අයවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෙම මුදල සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 1999 වර්ෂයේ සිට විවිධ ණයගැතියන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,921,575 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදීද අයවී නොතිබුණු අතර එම වටිනාකම තහවුරු කිරීමට අදාළ මූලාශ්‍ර ලියවිලි සභාව සතුව නොතිබුණි.

(ඈ) වසර 10 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.6,424,700 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම්ද, වසර 08 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.3,923,492 ක් වූ සේවකයින්ට ඉඩම් විකුණුම් අත්තිකාරම් ද, වසර 10 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින රු.11,215,850 ක බදු කුලී අත්තිකාරම් හා වසර 4 ක කාලයක සිට පැවත එන රු.2,500,000 ක ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වටිනාකම රු.201,500 ක් වූ අතර ඉන් රු.66,000 ක් වසර 2 ත් 10 ත් අතර දක්වා වූ අතර ඉතිරි රු 135,500 ක ශේෂය වර්ෂ 10 ට වැඩි කාලයක සිට පැවත එන බව නිරීක්ෂණය විය. තවද රු.800,130 ක් වටිනා වසර 10 කට අධික කාලයක් පැවතෙන විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ගෙවිය යුතු තැන්පත් පියවීමට කටයුතු කර නොතිබුණි.

2.4. <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගනුදෙනු සත්‌නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

ගිණුම් විෂය	ශේෂය රු.	ඉදිරිපත් නොවූ සාක්ෂි
ඉඩම්	676,169,345	ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන/ උපලේඛන
ගොඩනැගිලි	4,586,223	සමීක්ෂණ මණ්ඩල වාර්තා
පරිගණක හා උපාංග	7,771,227	
ලීබඩු හා සවිකිරීම්	857,543	
මෝටර් රථ	68,571,828	
කාර්යාල උපකරණ	20,977,190	
සුභ සාධන උපකරණ	1,031,996	
ලිපිද්‌‍රව්‍ය තොග	2,711,069	
වන්දි අවිනිශ්චිත ගිණුම	223,012,958	විස්තරාත්මක උප ලේඛන

2. 5. <u>නීති. රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2014 දෙසැම්බර් 18 දිනැති අංක 12/ 1237/ 501/ 030 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	2002 ජනවාරි 01 දින සිට 2004 මාර්තු 31 දින දක්වා කාලය තුළ සභාව විසින් අන්‍සතු කරන ලද ඉඩම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබූ කරුණු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් මාස 2 ක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස නම් කරනු ලැබූ නිලධාරීන් සිව් දෙනෙකු ගෙන් සමන්විත කමිටුවක් පත් කල යුතු වුවද එය සිදු කර නොතිබුණි.

(ආ) 2004 ජූලි 29 දිනැති අංක 25 හා 2004 අගෝස්තු 10 දිනැති අංක 25 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	(i) ආයතනය විසින් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2004 වර්ෂයේ සිට රු.1,228,664,542 ක් ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.
	(ii) මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක රු.7,000,000 ක මුදලක් 2010 දෙසැම්බර් 30 දින ආයෝජනය කර තිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.2. වගන්තිය	සෑම රාජ්‍ය ව්‍යවසායක්ම තම ආයතනික මෙහෙයුම් සහ ක්‍රියාකාරී කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ මෙහෙයවීම සඳහා ජ්‍යෝෂ්ඨ කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද, සභාව විසින් මෙම කළමනාකරණ කමිටු පත්කර නොතිබුණි.
(ඈ) 2000 දෙසැම්බර් 08 දිනැති අංක 2000/ 26 දරන පරිහරණ ගාස්තු අය කිරීම සම්බන්ධ අභ්‍යන්තර චක්‍රලේඛයේ 3 වගන්තිය	ඉඩම් අනවසර පරිහරණය කරන්නන්ගේ නාම ලැයිස්තුවක් දිස්ත්‍රික් කාර්යාල විසින් සකස් කල යුතු අතර, එහි පිටපතක් අධ්‍යක්ෂ (පාලන) වෙත එවිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.
(ඉ) 2008 අප්‍රේල් 17 දිනැති අංක 2008/ පොදු /1 දරන කොමිෂන් සභා චක්‍රලේඛය.	
(i) 1 (i) සහ (ii) වගන්තිය	අදාළ වර්ෂය සඳහා හිඟ පරිහරණ ගාස්තු එම වසර තුළදීම අයකර අවසන් කල යුතු වුවත්, බොහෝ අවස්ථාවලදී ඉඩම්

	විකිණීමේදී පරිහරණ ගාස්තු අයකිරීම සිදු කර තිබුණි.
(ii) 2 වගන්තිය	2001 ඔක්තෝබර් 10 දිනට පෙර සභාව සතු ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින හා පදිංචිව සිටින පුද්ගලයන්ගෙන් අය කල යුතු සියලු නිහ අනවසර පරිහරණ මුදල් නොපමාව අය කර අවසන් කල යුතු බව දක්වා තිබුණද එසේ කර නොතිබුණි.
(ඊ) 2007 සැප්තැම්බර් 12 දිනැති අංක 2007 / 15 දරන අභ්‍යන්තර චක්‍රලේඛය	දීර්ඝ කාලයක් අනවසරයෙන් භුක්ති විඳින සභාව සතු ඉඩම් මැන වෙන් කිරීමෙන් පසු, තක්සේරු කර, කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව බදු ඔප්පු මගින් ලබාදිය යුතු බව දක්වා තිබුණද 2015 වසර වන විටද අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් විශාල සංඛ්‍යාවක් පැවතුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය.</u>

3.1. <u>මූල්‍ය ප්‍රතිඵල.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 55,708,450 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.87,130,484 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.31,422,034 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ස්ථාවර තැන්පත් , හාණ්ඩාගාර බිල්පත් සහ සාමාන්‍ය ඉතුරුම් පොළී ආදායම් රු.36,664,274 කින් පහල යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවති නමුදු 2012 වර්ෂයෙන් පසුව ක්‍රමයෙන් අතිරික්තයේ අඩුවීමක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකිමේදී කොමිෂන් සභාවේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2015 දක්වා පිළිවෙලින් රු. 199,448,723, රු.282,011,837, රු.269,283,725, රු. 284,277,810, රු.269,448,792 ක් විය. ඒ අනුව 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී දායකත්වයේ ඉහල යාම සියයට 41 ක් වී තිබුණද ඊට පසු වර්ෂ වලදී ඒ මට්ටමින් පවත්වා ගෙන යාමට අපොහොසත්වී තිබුණි.

3.3. <u>සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි.</u>

2015 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව හා සභාව විසින් අධිකරණ 09 ක පවරා ඇති නඩු 503 ක් විභාග වෙමින් පැවතුණි.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1. <u>කාර්යසාධනය</u>

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 2 වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකුට අයිති උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම්, එම තැනැත්තන් අයිතිව තබා නොගැනීම සුරක්ෂිත කිරීම, පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම්වලින් ඇතිවන රැකිරක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය දෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම සභාවේ මූලික අරමුණ වේ. සභාවේ අරමුණු ඉටු කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංවර්ධනය සඳහා සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් ලේඛණයක් නොතිබීම හේතුවෙන් නිවැරදි තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි.

2016 මාර්තු 23 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමට ඉදිරිපත් කෙරුණු තොරතුරු අනුව සභාවේ ඉඩම් විකුණුම් සහ බදු දුන් ප්‍රමාණයන් ක්‍රමක්‍රමයෙන් අඩු වී තිබුණු අතර පෙර වර්ෂයට සාපේෂව එය සියයට 73 කින් අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාල ගැසට් නිවේදන පළ කරන ලද හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 106 ක් වර්ෂය ආරම්භයේ පැවතුණ ද සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීමට හැකිව තිබුනේ ලිපිගොනු 2 ක් සඳහා පමණක් විය. තවදුරටත් ලිපිගොනු 550 කට ආසන්න ප්‍රමාණයක තොරතුරු ලබා ගත යුතුව තිබෙන බවද නිරීක්ෂණය විය.

4.2. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) කාලවිලවත්ත ඉඩමේ කැබලි අංක 4 හුක්ති විඳින බදු ගැණුම්කරු විසින් එම ඉඩම 2002 වසරේ වෙළඳ වටිනාකම මත මිලට ගැනීමට එකඟ වී තිබියදී ඒ පිළිබඳ ප්‍රමාණවත් පියවර නොගැනීම නිසා අදාළ පුද්ගලයා වර්ෂ 20 කට අධික කාලයක් බදු ගෙවීමකින් තොරව ඉඩම හුක්ති විඳ තිබුණි.

(ii) පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව සංවර්ධනය නොකරන ලද ඉඩම් නැවත පවරා ගැනීමට ක්‍රියාකල යුතු වුවද බදුකරු විසින් වර්තමානයේ හුක්තියේ නොසිටි හා ඉඩමේ කිසිදු සංවර්ධන කටයුත්තක් නොකල කාලවිලවත්ත ඉඩමේ කැබලි අංක 5 සහ 7 කොටස් නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) මෙම ඉඩමේ අනවසරකරුවන් ව්‍යාජ ඔප්පු සකසා හුක්තියේ සිටින අතර ඔවුන්ට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියාකිරීමට හෝ 1975 අංක 39 දරන සංශෝධන පනතේ 42 (ඇ) හි 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව අනවසරකරුවන් ඉවත් කිරීමට සහාව කටයුතු කර නොතිබුණි.

(ආ) පනතේ 33 වගන්තිය ප්‍රකාරව හිමිකම් තහවුරු වී ඇති යම් තැනැත්තෙකුට ගෙවිය යුතු යම් වන්දියක් ඔහු විසින් නොපිළිගන්නා ලද අවස්ථාවක හෝ, ඒ තැනැත්තා මියගොස් ඇති විට හෝ, ඔහු ගැන සොයාගැනීමට නොහැකි අවස්ථාවක වන්දිය හිමි තැනැත්තන් විසින් ලබා ගැනීම සඳහා සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක තැන්පත් කළයුතුය. එසේ වුවද ලිපිගොනු 127 කට අදාළව මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට විගණිත දිනය වූ 2016 අප්‍රේල් 30 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) වන්දි අවිනිශ්චිත (II) ගිණුමෙන් වන්දි ගෙවිය යුතු පුද්ගලයන් නිශ්චිතව හඳුනා නොගැනීම නිසා වර්ෂ ගණනාවක සිට වන්දි නිරවුල් කිරීමක් සිදු වී නොතිබුණු අතර රු. 109,959,493 ක් වූ ශේෂය වර්ෂ ගණනාවක් පුරා නොවෙනස්ව පැවතුණි.

4.3. <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 අප්‍රේල් 02 දිනැති අංක 6873 දරන කොමිෂන් පත්‍රිකාව අනුව ස්කන්ද කුමාර කෝවිල වෙත බදු පදනම මත ලබා දුන් අක්කර 04 රූඩ් 02 පර්චස් 05 ක බිම් ප්‍රමාණය සඳහා 1978 වර්ෂයේ සිට තක්සේරු කර බදු මුදල් අය කිරීමට කටයුතු කල යුතු වුවද, වර්ෂ 35 කට අධික කාලයක සිට සභාව සතු මෙම ඉඩමෙන් කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි.

(ආ) සභාව විසින් බදුදීම අවලංගු කරනු ලැබූ ඇතැම් ඉඩම් අනවසර පදිංචි කරුවන් විසින් පරිහරනය කරනු ලබන අතර, එම ඉඩම් වලින් කිසිදු ආදායමක් සභාවට ලැබී නොතිබුණි.

4.4. <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු.</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දීර්ඝකාලීන බදු පදනම මත නුගේදොලවත්ත ඉඩමෙන් අක්කර 4 රූඩ් 2 පර්චස් 16.96 ක වපසරියකින් යුත් කොටසක් 30 අවුරුදු බදු පදනම මත මිශ්‍ර භෝග හා පලතුරු වගාවක් සඳහා ලබා දී තිබුණු නමුත්, එහි බර වාහන පැදවීම පුහුණු

කිරීමේ ආයතනයක් පවත්වාගෙන යන බවට කේෂ්ත්‍ර පරීක්ෂාවක් මගින් තහවුරු කර තිබුණි. ඒ අනුව 2002 මැයි මස 23 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2/ 1/ 145 (iii) හි 13 වන වගන්තිය ප්‍රකාරව ඉඩම ලබා ගැනීමේ පරමාර්ථයෙන් බැහැර වීම මත පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බවත් පදනම් වෙනසකට අනුව බදු රේටයන් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) පින්නලන්ද වත්ත ඉඩමෙන් පිඹුරු අංක 53 හි කැබලි අංක 1 හා 2 හි අක්කර 16 රූඩ්0 පර්වස් 22 ක ප්‍රමාණයක් අලි අනාථාගාරයක් පවත්වාගෙන යාම සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත බදු දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව තාවකාලිකව තීරණය කල බදු මුදලක් අයකර 1974 වසරේ සිට රඹුක්කන උපදිසාපති වෙත භාරදී ඇති මෙම ඉඩම 2008 දෙසැම්බර් 18 දිනැති 587 වැනි කොමිෂන් සභා වාරයේ කොමිෂන් පත්‍රිකා අංක 6751 ට අනුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත 2009 වර්ෂයේ සිට වසර 30 ක කාලයක් සඳහා බදු දීමට නිර්දේශ කර තිබුණද, ඊට අදාළ පැවරුම් ඔප්පු හෝ බදු ගිවිසුම් කිසිවක් සකස්කර නොතිබුණි.

(ii) 1974 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා නව තක්සේරුව අනුව හිඟ බදු ශේෂය ලෙස රු. 6,178,731 ක් දක්වා තිබුණු අතර පැවරුම් ඔප්පුවක් හෝ බදු ගිවිසුම් ඔප්පුවක් නොමැති වීම මත එම හිඟ ශේෂය අයකර ගැනීම වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ගයකට යොමු වීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

මෙහිදී සත්වෝද්‍යානය රජයේ ආයතනයක් වන බැවින් බදු පදනම මත ලබාදීම නීත්‍යානුකූල නොවන බැවින්ද, මෙතෙක් බදු පදනම මත ලබාදුන් නමුත් මුදල් නොගෙවීම නිසාද, සාකච්ඡාවකට කැඳවා, ගත්

තීරණය අනුව 2017 වර්ෂයේදී අයවැයෙන් මුදල් ප්‍රතිපාදන ලබාගෙන සභාවට වන්දි ලබාදීමේ පදනම මත අත්පත් කර ගැනීමෙන් පවරා දීමට පියවර ගෙන ඇති බවත් සභාපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) කෑගල්ල පින්නවල වත්තේ පේෂකර්ම දෙපාර්තමේන්තුව වෙත රූඩ් 02 ක ඉඩමක් පවරා තිබුණු නමුත් ඊට අදාළවද කිසිදු නීතිමය ලියවිල්ලක් සකස් කර නොතිබුණි.

4.5 <u>නිෂ්කාර්ය හෝ ඌන උයෝජිත වත්කම්</u>

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වේවැල්තලාව වත්ත ඉඩමේ අක්කර 23 රූඩ් 03 පර්චස් 15 ක් 2004 මාර්තු 18 දින සිට විගණන දිනය වූ 2015 දෙසැම්බර් 31 දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

4.6. <u>හඳුනාගන්නා ලද පාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාලවිලවත්ත කැබලි අංක 09 හෝටල් සමාගමක් විසින් ගුක්ති විදීම සම්බන්ධයෙන් සිදු කල භෞතික විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 වර්ෂයේදී බෙරුවල නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබූ අතර ඊට හෝටල් ව්‍යාපෘතියක්ද ඇතුළත්ව තිබුණෙන් එය ක්‍රියාත්මක කිරීම සඳහා සහ අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා පෞද්ගලික කල්බදු සමාගමක් ගිවිසුම් ගතව තිබුණි.

(ii) පෞද්ගලික කල්බදු සමාගම ඉඩම පවරා ගන්නා අවස්ථාව වන විට පෞද්ගලික හෝටල් සමාගමක් වර්ෂ 30 කට අධික කාලයක් අනවසරයෙන් හෝටලයක් පවත්වාගෙන ගොස් තිබුණ ද සභාව ඊට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) පෞද්ගලික සමාගමක් වෙත ලේලන්ඩ් වත්ත කර්මාන්තපුරයෙන් අක්කර 06 ක ඉඩමක් 50 අවුරුදු බද්දට 2005 සැප්තැම්බර් 09 දින සිට ලබාදී තිබීම සම්බන්ධයෙන් සිදු කල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2012 මාර්තු 28 දිනැති අංක 7931 දරන කොමිෂන් සභා පත්‍රිකාව අනුව වසර 5 කට වරක් බදු සංශෝධනය කර බදු ආදායම් රැස්කර ගැනීම් කල යුතු වුවද, මෙම සමාගමේ ඊලඟ වසර 5 සඳහා කලින් නියම කල මුදලට සියයට 50 ක් එකතු කර බදු නියම කලද එම මුදල ගෙවීමට සමාගම එකඟ වී නොතිබුණි.

(ii) ආයතනයේ පාලන වක්‍රලේඛ 2005/07 පරිදි ගෙවීම ප්‍රමාද වීම වෙනුවෙන් සියයට 10 ක දඩ මුදලක් අයකල යුතු වුවද එසේ සිදු කර නොතිබුණු අතර අහිමි වූ මුදල රු.960,000 ක් විය.

(iii) සභාව විසින් කෘෂිකාර්මික ඉඩම් බදු දීමේදී තක්සේරු වටිනාකමින් සියයට 4 ක බදු ප්‍රතිශතයකුත්, කාර්මික අංශයෙන් සියයට 6 ප්‍රතිශතයක්ද අය කිරීම සභාවේ සමාන්‍ය ක්‍රියාවලිය වුවද කාර්මික අංශයට අදාල වූ මෙම ආයතනයෙන් සියයට 4 ක ප්‍රතිශතයක් පමණක් අය කර තිබුණි. මේ හේතුවෙන් 2015 වර්ෂය දක්වා රු.8,000,000 ක් අඩුවෙන් අයකර තිබුණි.

(ඇ) මාදම්පේ දිස්ත්‍රික් ඉඩම් බල ප්‍රදේශයට අයත් දවුල්කුරුඳුවත්ත ඉඩමේ පවත්වාගෙන යන පොල් වගාවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.306,850 ක ආදායමක් ලැබී තිබුණද මුරකරු දීමනා සහ වෙනත් වියදම් වශයෙන් එකතුව රු. 445,397 ක් දරා තිබීම හේතුවෙන් හා රු.138,547 ක පාඩුවක් සිදුවී තිබුණි.මේ අනුව සභාව යටතේ පාලනය වන මෙවැනි ඉඩම් තවදුරටත් සංවර්ධනය කර ලැබෙන ආදායම් වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

4.7. කාර්යමණ්ඩල පරිපාලනය

සභාවේ අධ්‍යක්ෂ (මුදල්) තනතුර වර්ෂ 07 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවති තිබුණු අතර, අධ්‍යක්ෂ (නීති) හා අධ්‍යක්ෂ (ඉඩම්) යන තනතුරු ද වර්ෂ 2 ක කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. මෙකී පුරප්පාඩු සඳහා වැඩ බැලීමේ පදනමින් පත්කිරීම් සිදු කර තිබුණු අතර ඒ හේතුවෙන් ආයතනය තීරණ ගැනීමේදී බලපෑමක් සිදු වීමට ඉඩකඩ පැවතීමට හැකියාවක් පවතින බැවි නිරීක්ෂණය විය.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1. සංයුක්ත සැලැස්ම.

2015 - 2019 කාලසීමාවට අදාලව පිළියෙල කල සංයුක්ත සැලැස්මෙහි 2003 ජුනි 02 දිනැති අංක PED / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව, පූර්ව වර්ෂ 3 කට අදාල මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය කර නොතිබුණි.

5.2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

(අ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ උපරිම සීමාව ඉක්මවා ගිය ඉඩම් හෙළිදරව් කරගැනීම, විහාර දේවාලගම් පනත අනුව ඉඩම් නිදහස් කිරීම සඳහා භදුනා ගැනීම, කොමිසම වෙත පැවරී ඇති ඉඩම් ලියාපදිංචි කිරීම හා හිමිකම් හා ලේඛන ලියාපදිංචි කිරීම, ප්‍රධාන ගබඩාව විධිමත් ලෙස සකස් කිරීම, ප්‍රධාන ගබඩාව පරිගණකගත කිරීම සහ ඉඩම් විෂය පිළිබඳව දෙදිනක වැඩසටහන් පැවැත්වීම යනාදී ක්‍රියාකාරකම් කිසිවක් ඉටු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව දක්වා තිබූ ක්‍රියාකාරකම් 14 ක ඉලක්කයන්ගෙන් සියයට 50 කට අඩු ප්‍රගතියක් අත් කරගෙන තිබුණි.

5.3. අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සැලැස්මේ දක්වා තිබූ ආදායම් අංශයෙහි ලෙජර් පැවැත්වීම සහ හිඟ බදු අයකර ගැනීම හා නීති අංශයෙහි උසාවි වර්ග අනුව නඩු භදුනාගැනීම් හා වියදම් පිළිබඳ පරීක්ෂාවන් පිළිබඳ සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛ ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.5. අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ තථ්‍ය හා අයවැය ගත ආදායම් හා වියදම් පරීක්ෂාවේදී ආදායමෙහි සියයට 34 සිට සියයට 84 ක් දක්වා සහ වියදමෙහි සියයට 30 සිට සියයට 6141 ක් දක්වාද සැලකිය යුතු විචලනයන් අනාවරනය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.6. වාර්ෂික වාර්තා සභාගත කිරීම

2013 සහ 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2016 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

5.7. නොවිසඳී ඇති විගණන ඡේද

ව්‍යාජ ගනුදෙනුවක් ලෙස හඳුනාගෙන තිබූ පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීම සඳහා 2002 වර්ෂයේ ගෙවා තිබුණු රු. 17,000,000 ක් මුදලක් පරිගණක අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි. මේ අනුව අත්තිකාරම් ලෙස ගිණුම් වලින් පෙන්නුම් කෙරෙන සාවද්‍ය මුදල නිරවුල් කර ගැනීමට අදාලව සභාවට ඉදිරිපත් කර සාකච්ඡා කිරීමෙන් අනතුරුව, භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බවට 2015 ජුනි 17 දිනැති විගණන කමිටුවේදී තීරණය කෙරුණි. මෙම ගිණුම් සටහන නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට විගණිත දිනය වූ 2016 අප්‍රේල් 29 දින වන විටත් නොහැකි වී තිබුණි.

6. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ණය වූ අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුවේ.

පද්ධති හා පාලන කේෂ්ත්‍රය	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	අදායම් අංශය, ඉඩම් පැවරීම් අංශය, ව්‍යාපෘති අංශය ඇතුළු අනෙකුත් සියලුම අංශ ගිණුම් අංශය සමඟ සම්බන්ධීකරණය නොවීම.
(ආ) ණයගැති පාලනය	(i) හිඟ ආදායම් පිළිබඳ වාර්තා යාවත්කාලීන නොවීම හා හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම.
	(ii) රාජ්‍ය ආයතන වෙතින් සභාවට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් අදාල අංශ විසින් දැනුම් නොදීම හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි වීම
	(iii) අයවිය යුතු බදු මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබීම
	(iv) ණයගැති ශේෂ සනාථ ලබා නොගැනීම.
(ඇ) ලේඛන පවත්වා නොතිබීම	ඉඩම් ලේඛනයක් හා බදු දුන් ඉඩම්, විකිණීමෙන් පැවරී ඇති ඉඩම් සම්බන්ධ ලේඛන නොතිබීම.
(ඈ) ඉඩම් බදු දීම	ඉඩම් බදු දීමට අදාළව, නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති